සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

හින්දු ශිෂ්ටාචාරය I
இந்து நாகரிகம் I
Hindu Civilization I

46 S I

2018.08.06 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ඍග් වේදයේ ඇති සූක්ත සංඛ්‍යාව කොපමණ ද?
(1) 1028 (2) 1050 (3) 1350 (4) 2010 (5) 2018

**2.** යාග පිළිවෙත්වලට වැදගත්කම ලබාදෙන්නේ,
(1) ඍග් වේදයයි. (2) අදර්ව වේදයයි. (3) යජුර් වේදයයි. (4) සාම වේදයයි. (5) ආයුර් වේදයයි.

**3.** වේදවල සඳහන් වන දෙවියන්ගේ නම් පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ඉන්ද්‍රන්, විෂ්ණු, දූර්ගා
(2) අග්නි, වරුණන්, රුද්‍රන්
(3) රුද්‍රන්, සාවිත්‍රී, වරුණන්
(4) උමෛ, පූෂන්, බෛරවර්
(5) ශිව දෙවියන්, වරුණන්, සප්තකන්‍යා

**4.** 'අබෞරුෂෙයම්' යන්නෙහි තේරුම කුමක් ද?
(1) අක්ෂරවලින් නොලියන ලද්දකි.
(2) ප්‍රකාශ කිරීම හා සවන්දීම තුළින් පැවත එන්නෙකි.
(3) දැනුම් භාණ්ඩාගාරයක්ව පවතී.
(4) මිනිසුන් විසින් නොසාදා දේවත්වයෙන් යුක්ත එකකි.
(5) ඍෂිවරුන්ගෙන් නිර්මාණය කරන ලද්දකි.

**5.** 'අර්පුද තිරුවන්දාදි' ලියන ලද්දේ,
(1) සේන්දනාර් විසිනි.
(2) කාරෛක්කාල් අම්මයාර් විසිනි.
(3) වේනාට්ටඩිහල් විසිනි.
(4) කණ්ඩරාදිත්තර් විසිනි.
(5) නම්බියාණ්ඩාර් නම්බි විසිනි.

**6.** දෙවියන් යාළුවෙකු සේ සලකා වන්දනා කළ නායනාර්තුමා
(1) සිරුත්තොණ්ඩර් ය.
(2) කණ්ණප්පර් ය.
(3) පූසලාර් ය.
(4) සුන්දරර් ය.
(5) සේරමාන් පෙරුමාල් ය.

**7.** සිට්ප ශාස්ත්‍ර නීතිවලට අනුව නිර්මාණය කරනු ලබන වර්ග තුනේ දෙව් පිළිම ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) අමෛදි පිළිම, අරුල් පිළිම, අසල පිළිම
(2) සිත්තිරම්, සිත්තිරාර්ත්තම්, සිත්තිරාපාසම්
(3) සල පිළිම, අසල පිළිම, සලාසල පිළිම
(4) ශිවලිංගය, ගණපති පිළිම, මුරුගන් පිළිම
(5) දක්ෂිණාමූර්ති පිළිම, අරුල් පිළිම, අඝෝර පිළිම

**8.** 'රාජසිම්ම පල්ලවේෂ්වරම්' යනුවෙන් හැඳින්වූ දේවාලය කුමක් ද?
(1) මාමල්ලපුරම් වෙරළ දේවාලය
(2) තිරුච්චි කුඩෛවරෛ දේවාලය
(3) කාංචි කෛලාසනාථ දේවාලය
(4) පනෛමලෛ දේවාලය
(5) ධර්මරාජ රථ දේවාලය

[දෙවැනි පිටුව බලන්න.

**9.** සංග යුගයේ සාහිත්‍යවල කාන්තාර ප්‍රදේශයට අයත් දෙවියෙකු ලෙස ප්‍රශංසා ලබන්නේ,
(1) විෂ්ණු ය. (2) කොට්‍රවෛ ය. (3) ඉන්ද්‍රන් ය. (4) මුරුගන් ය. (5) වරුණන් ය.

**10.** මහේන්ද්‍රවර්මන් විසින් ගුහා දේවාල නිර්මාණය කරන ලද ස්ථානවල නම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) තංජෛ, කාංචි, තිරුත්තනි
(2) මණ්ඩගප්පට්ටු, මාමණ්ඩූර්, වල්ලම්
(3) මාමණ්ඩූර්, මතුරා, වල්ලම්
(4) තිරුච්චිරාප්පල්ලි, තංජෛ, මාමණ්ඩූර්
(5) මතුරා, කන්නෝසි, මාමල්ලපුරම්

**11.** තමිල්නාඩුවේ විශිෂ්ට වාත්තු පිළිම බිහි වූයේ,
(1) චෝල යුගයේ ය.
(2) පාණ්ඩියර් යුගයේ ය.
(3) සංග යුගයේ ය.
(4) පල්ලව යුගයේ ය.
(5) විජය නගර නායක්කර් යුගයේ ය.

**12.** දෙවියන්, දේව අවතාර, වීරයන් කළ වීර ක්‍රියා, නීතිමාලා යනාදිය පිළිබඳව විස්තර කරන ග්‍රන්ථය
(1) තිරුමන්දිරම් ය.
(2) තන්දිරංගල් ය.
(3) ඉදිහාසංගල් ය.
(4) සෞන්දර්ය ලහරි ය.
(5) තිරුමුරෛහල් ය.

**13.** සාමාන්‍ය ජනතාව අතර පැවති මාන්ත්‍රික විශ්වාසවලට වැඩි වැදගත්කමක් ලබාදෙනු ලබන ග්‍රන්ථය
(1) මනුස්මිරුදි ය. (2) රාමායණය ය. (3) සාගුන්තලම් ය. (4) අදර්ව වේදය ය. (5) ඍග් වේදය ය.

**14.** වේද හතරින්ම සත්‍ය දෙයක් ලෙස ප්‍රශංසා කරනු ලැබූ ශිව දෙවියන්ගේ 'නමසිවාය' යන මන්ත්‍රය මුල්වරට භාවිතය වූ ග්‍රන්ථය
(1) මහාභාරතයේ භගවත්ගීතාව ය.
(2) යජුර් වේදයේ සදරුත්ත්‍රියම් ය.
(3) රාමායණයේ යෝග වාශිෂ්ටම් ය.
(4) පදංජලිගේ යෝග සූත්තිරම් ය.
(5) කාලිදාසගේ කුමාරසම්බවම් ය.

**15.** තමිල්නාඩුවේ ගින්දර පසුබිම් කර ගනිමින් ශිව දෙවියන් වන්දනා කරනු ලබන දේවාලය
(1) තිරුවෛයාරු ය.
(2) සිදම්බරම් ය.
(3) තිරුක්කාලත්ති ය.
(4) තිරුවන්නාමලෛ ය.
(5) තිරුකඩවූර් ය.

**16.** තිරුමාල් දෙවියන්ගේ මූර්ති භේද පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) වියුහම්, වින්දු, අර්චෛ
(2) පරම්, වියුහම්, අන්තර්යාමි
(3) පරම්, නාදම්, වියුහම්
(4) විභවම්, කලෛ, අන්තර්යාමි
(5) වියුහම්, විභවම්, වින්දු

**17.** ශෛව ආගමික සම්ප්‍රදාය අනුව අපේ ශරීරය අපට ලැබීමේ අරමුණ වන්නේ,
(1) ලොව ජීවිතය පවත්වා ගෙන යාමයි.
(2) දෙවියන්ට වන්දනා කර විමුක්තිය ලබා ගැනීමයි.
(3) තම පවුල සමග සතුටින් ජීවත්වීමයි.
(4) අධ්‍යාපන කටයුතුවල උසස් තත්ත්වයක් ලබා ගැනීමයි.
(5) ශාරීරික ව්‍යායාම මගින් ශරීරය ආරක්ෂා කර ගැනීමයි.

**18.** තංජෛ මහා දේවාලයට කියනු ලබන තවත් නමක් වන්නේ,
(1) ඒගාම්බරේෂ්වරර් දේවාලයයි.
(2) බෘහදීෂ්වරර් දේවාලයයි.
(3) කෛලාසනාථ දේවාලයයි.
(4) තෝනිපුරත්තීසර් දේවාලයයි.
(5) තිරුවීරට්ටානේෂ්වරර් දේවාලයයි.

**19.** දේවාල ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව පැහැදිලි කරන ග්‍රන්ථය
(1) වාස්තු ශාස්ත්‍රය ය.
(2) කල්ප සූත්‍රය ය.
(3) භක්ති සූත්‍රය ය.
(4) කුත්ත නූල් ය.
(5) සිරෞද සූත්‍රය ය.

**20.** "උයිරාවණම් ඉරුන්දු උට්ටෘ නෝක්කි උල්ලක් කිලියිල් උරුවෙලුදි..." යන ගීතය මගින් කලාවන්ගේ ගති ලක්ෂණ ප්‍රශංසා කළේ,
(1) තිරුඥානසම්පන්තර් ය.
(2) තිරුනාවුක්කරසර් ය.
(3) කලායෝගි ආනන්ද කුමාරස්වාමි ය.
(4) මාණික්කවාසහර් ය.
(5) සුවාමි විපුලානන්තර් ය.

**21.** උපනිෂද් මගින් හින්දු දාර්ශනික සත්‍ය ප්‍රකාශන කරන ක්‍රම පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) සංවාදය, ප්‍රායෝගික, භජන්
(2) දේශනාව, විවාදය, පාවනෛ
(3) විවාදය, ප්‍රායෝගික, සංවාදය
(4) සංවාදය, විමර්ශන, පාවනෛ
(5) ප්‍රායෝගික, භාවනාව, පාවනෛ

[තුන්වැනි පිටුව බලන්න.

**22.** ශිවාගමම්වලින් තුනක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) සුප්‍රභේදම්, වාදුලම්, පාංචරාත්තිරම්
(2) පාරමේසුවරම්, කිරණම්, වෛගානසම්
(3) දීප්තම්, සූක්කුමම්, ගුරුගීතෛ
(4) කාරනම්, කාම්හම්, සුප්‍රභේදම්
(5) සහස්‍රම්, වෛගානසම්, මිරුගේන්දිරම්

**23.** ශිවාගමංගල් මගින් විස්තර කෙරෙන පිළිවෙත්වල 'කර්ෂණම්'' මගින් අදහස් කරනුයේ කුමක් ද?
(1) පිළිම සාදන ක්‍රම
(2) දේවාල නිර්මාණය කිරීමට යෝජිත ස්ථානයෙහි බිම සකස් කිරීම
(3) දේවාලවලට අදාළ නිර්මාණ ශිල්ප ක්‍රමය
(4) දේවාලයේ සිදුවන දේවරූප වන්දනාව
(5) දේවාලයේ සිදුවන තේරු උත්සවය

**24.** දෙවියන්ගේ ගති ලක්ෂණ අටෙහි තුනක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) සර්ව බලධාරී, සර්ව වාසී, පිළිම රුවෙන් සිටීම
(2) පුද්ගල නිශ්‍රිත, ශුද්ධ වූ ශරීරයෙන් යුතු වීම, සර්ව දැනුමැති
(3) අති ඇලීම සහ විමුක්තිය මවන්නා, ත්‍රිමල විනාශ කරන්නා, පාසංගල්වලින් ඈත්ව සිටින්නා
(4) යතාර්ථ හැඟීමෙන් යුක්ත, ආශීර්වාද කරන්නා, එළිය සහ ශබ්දය ලෙස සිටින්නා
(5) දිව්‍ය සැපත ඇති, සර්ව හැඟීමැති, මහා ආශීර්වාදාත්මක

**25.** 'කේවලාත්වෛදම්' යන දාර්ශනික මතය පිළිබඳව පැහැදිලි කළේ
(1) නිම්බාර්කර් ය.
(2) වල්ලබර් ය.
(3) ශංකරර් ය.
(4) ශ්‍රී ශෛදන්යර් ය.
(5) රාමානුජර් ය.

**26.** කර්මයෝගිට හගවත් ගීතා කතෘ විසින් ලබාදෙනු ලබන විශේෂ නාමය වන්නේ,
(1) රාජයෝගි ය.
(2) ස්තිදප්‍රග්ඥන් ය.
(3) ඥානි ය.
(4) සිත්තන් ය.
(5) පණ්ඩිතන් ය.

**27.** 'අවෛදික ආගම්' යනුවෙන් අදහස් කරනු ලබන්නේ
(1) වේද පමණක් පිළිගන්නා ආගම් ය.
(2) වේද පිළිගෙන ආගමම් පිළිනොගන්නා ආගම් ය.
(3) වේද විටින් විට පිළිගන්නා ආගම් ය.
(4) වේද පිළිනොගන්නා ආගම් ය.
(5) ආගමම් පමණක් පිළිගන්නා ආගම් ය.

**28.** ධර්ම ශාත්‍ර රචකයින් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) මනු, වශිෂ්ටර්, වාල්මිකි
(2) කෞටිල්‍ය, පරාසරර්, කාලිදාසර්
(3) පරාසරර්, වශිෂ්ටර්, ව්‍යාසර්
(4) කාලිදාසර්, මනු, වාල්මිකි
(5) මනු, පරාසරර්, නාරදර්

**29.** "ප්‍රභක්තිය පිළිපැදීමෙන් විමුක්තිය ලබාගත හැක." යනුවෙන් පැවසුවේ
(1) රාමානුජර් ය.
(2) ශංකර් ය.
(3) මත්තුවර් ය.
(4) රමණර් ය.
(5) තායුමානවර් ය.

**30.** ශෛව සිද්ධාන්තයේ දේවාතිය හා සංකේතාත්මක බවින් යුතු දෙවියන්ගේ ගති ලක්ෂණ පෙන්නුම් කරන වචනය කුමක් ද?
(1) අනාදි
(2) සොරූහම්
(3) අවදාරම්
(4) තඩත්තම්
(5) විමර්සනම්

**31.** පංචාංගයේ ඇතුළත් වැදගත් අංග පහකින් සමන්විත කාණ්ඩය කුමක් ද?
(1) වර්ෂය, සතිය, මාසය, යෝගය, තාරකාව
(2) තාරකාව, සතිය, සාදගම්, මාසය, කරණම්
(3) සතිය, තිදි, තාරකාව, යෝගය, කරණම්
(4) වසන්තය, වර්ෂය. තිදි, රාශිය, කරණම්
(5) යෝගය, මාසය, සුක්‍රනාඩි, කෞශික නාඩි, රාහු කාලය

**32.** හින්දු භක්තිකයන්ගේ දේශපාලන සහ ආර්ථික මත පිළිබඳ පැහැදිලි කරන ග්‍රන්ථය
(1) ඥානාමිර්දම් ය.
(2) කෛවල්‍ය නවනීදම් ය.
(3) පරාසරස්මිරුදිය.
(4) මනුදර්ම ශාස්ත්‍රය ය.
(5) අර්ථ ශාස්ත්‍රය ය.

**33.** "නුඹට අයිති වන්නේ නුඹ කරන ක්‍රියාව පමණි, ක්‍රියාවේ ඵලය සහ අවසානය නුඹේ අයිතිවාසිකමක් නොවේ." යනුවෙන් උපදෙස් ලබාදෙන ග්‍රන්ථය වන්නේ,
(1) අර්ථ ශාස්ත්‍රය ය.
(2) සුක්‍රනීති ය.
(3) යෝග ශාස්ත්‍රය ය.
(4) හගවත්ගීතාව ය.
(5) මානසාරම් ය.

[හතරවැනි පිටුව බලන්න.

**34.** මෙයිකණ්ඩදේවර්ගේ ප්‍රථම ගෝලයා වන්නේ,
(1) අරුණන්දි සිවාචාරියර් ය. (2) තිරුකඩවූර් උයියවන්ද දේවර් ය.
(3) මනවාසගං කඩන්ද දේවර් ය. (4) උමාපති සිවාචාරියර් ය.
(5) මරෛඥාන සම්පන්තර් ය.

**35.** ශෛව සිද්ධාන්තයේ 'පාසම්' යන්න සංකේතවත් කරන අංග තුන ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) කන්මම්, මායේයම්, ව්‍යාපකම් (2) පදි, පසු, පාසම්
(3) තිරෝදායි, මායේයම්, මලම් (4) ආණවම්, කන්මම්, මායෛ
(5) ආණවම්, කන්මම්, පසුත්තුවම්

- පහත දී ඇති වචන අතුරෙන් දෙකක් විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන, අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>ලෝක නීතිය | B<br>හවායි | C<br>මහාරාශ්‍රය | D<br>තිරුමුරෛහල් | E<br>ප්‍රමාණ දීපිකෛ |
| F<br>නම්බියාණ්ඩාර් නම්බි | G<br>එල්ලෝරා | H<br>ඥානප්‍රකාශ මුනිවර් | I<br>ශිවසුබ්‍රමණිය සුවාමිහල් | J<br>නීති වෙන්පා |

**36.** ශිව දෙවියන්ගේ වීර ක්‍රියා පිළිබඳව සඳහන් කරන කැටයම් පිහිටා තිබෙන ස්ථාන ඇතුළත් යුගලය කුමක් ද?
(1) A G (2) B H (3) C G (4) E J (5) F G

**37.** ශ්‍රී ලංකාවේ සිදුකරන ලද ශෛව සිද්ධාන්ත සොයාගැනීම හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A J (2) B H (3) D F (4) E H (5) H J

**38.** තමිල්නාඩුවේ විජයනගර නායක්කර් රජ සමයේ බිහි වූ ධර්මය සම්බන්ධ ග්‍රන්ථ සඳහන් වන යුගලය කුමක් ද?
(1) A I (2) A J (3) B H (4) C G (5) D F

**39.** ඇමෙරිකාවේ පවතින හින්දු ආගම හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A J (2) B H (3) B I (4) D I (5) E H

**40.** තමිල්නාඩුවේ ඇති වූ ශෛව ආගමික වර්ධනය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A G (2) C G (3) D F (4) D I (5) H I

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** කරුණ තෝරන්න.

**41. හින්දු ශිෂ්ටාචාරයේ ඒකීයභාවය හා විශිෂ්ටත්වය**
(1) ලොව ශිෂ්ටාචාරවල හින්දු ශිෂ්ටාචාරය ප්‍රචලිත ය.
(2) හින්දු ශිෂ්ටාචාරයේ පැරණි බවට සාක්ෂිය වන්නේ වේද සාහිත්‍යයයි.
(3) හින්දු ශිෂ්ටාචාරය ආගම, දර්ශනය, කලා, සමාජය හා විද්‍යාව යනාදියෙන් සමන්විතයි.
(4) හින්දු ශිෂ්ටාචාර ඉතිහාසයේ හින්දු භක්තිකයන්ගේ දේශපාලන සහභාගිත්වය පිළිබඳ පුවත් දුර්ලභ ය.
(5) දේවාල වන්දනා විශේෂත්වය හින්දු ශිෂ්ටාචාරයේ ඇතුළත්ව තිබීම සඳහන් කළ යුතු දෙයකි.

**42. හින්දු නිම්න ශිෂ්ටාචාරය නදී තීරයාශ්‍රිත ශිෂ්ටාචාරයකි.**
(1) හින්දු නිම්න ප්‍රදේශයට, මොහෙන්ජදාරෝ, හරප්පා යන ස්ථාන ඇතුළත් ය.
(2) මෙහි සර් ජෝන් මාර්ෂල්ගේ නායකත්වයෙන් පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදු කරන ලදී.
(3) මෙම ප්‍රදේශයෙන් සොයාගත් පෞරාණික ලාංඡන මගින් එම කාලයේ එහි ජීවත් වූ ජනයා හින්දු ආගමික දෙවිවරු වන්දනා කළ බව තහවුරු වේ.
(4) ශෛව ආගමය හා සම්බන්ධ ශිව වන්දනාව හොඳින් සිදු වූ බව මුද්‍රා තුළින් පෙන්නුම් කරන බව විශාරදයින්ගේ මතයයි.
(5) හින්දු නිම්න ප්‍රදේශයේ ගෘහ නිර්මාණ ශිල්පය වර්ධනය වූ නමුත් කලාවන්ගේ වර්ධනය ඉතා සුළු බව විශාරදයින්ගේ මතයයි.

**43. මුරුග වන්දනාවේ පුනර්ජීවනයට මුලපිරූ ආරුණගිරිනාදර්**
(1) අරුණගිරිනාදර් තමිල්නාඩුවේ ක්‍රි.ව.15 වන සියවසේ මුරුග වන්දනාවට වැදගත් ස්ථානයක් ලබා දුන්නේ ය.
(2) ඔහුගේ තිරුප්පුහල් ග්‍රන්ථයේ ඇති 'සන්ද පාක්කල්' යන ගීතිකා මහජනතාව අතර මුරුග දෙවියන් කෙරෙහි භක්තිය වර්ධන කළේය.
(3) මුරුග දෙවියන් ඔහුට නයන තීට්ශෛ සහ තිරුවඩි තීට්ශෛ ලබා දී ආශිර්වාද කළේ ය.
(4) ඔහු තම බාලවියේ අධ්‍යාපනය කෙරෙහි එතරම් උනන්දුවක් දැක්වූයේ නැත.
(5) මුරුග දෙවියන් ප්‍රශංසා කරමින් ඔහු ගැයූ 'කන්දරනුභූදි', කියවන්නාගේ සිතේ භක්තිය ඇති කරයි.

[පස්වැනි පිටුව බලන්න.

**44. හින්දු ශිෂ්ටාචාර ඉතිහාසයේ විශේෂත්වයක් ලබන හින්දු වෛදකම**

(1) හින්දු ශිෂ්ටාචාර ඉතිහාසයේ විශේෂත්වයක් ලැබූ විද්‍යාත්මක දර්ශනවල වෛදකම උසස් ය.
(2) ඍග් වේදය, වෛදකම හා සම්බන්ධ වාතය, පිත, සෙම යනාදි රෝග පිළිබඳව පැහැදිලි කරයි.
(3) යජුර් වේදයේ හෘද රෝග, කාෂය, ලාදුරු යනාදි රෝග සුව කළ හැකි මන්ත්‍ර ඇත.
(4) හින්දු වෛද්‍ය ග්‍රන්ථවල වර්ධනයට උදව් වූ අය සහ එම ග්‍රන්ථ පිළිබඳව තොරතුරු සොයාගත නොහැකි ය.
(5) හින්දු වෛදකමේ යෝගය, භාවනාව යනාදිය ලෙඩ රෝගවලින් ආරක්ෂා කරයි.

**45. ශිව දෙවියන්ගේ ලිංගෝත්පව මූර්තයේ විශේෂත්වය**

(1) 'ලිංගෝත්පවම්' යන්න ශිවලිංගය තුළ ඇති පෙනුම යන තේරුම ලබා දෙයි.
(2) ශිව දෙවියන්ගේ මෙම මූර්තය ශිව දේවාලවල ප්‍රධාන කුටියට දකුණු දිසාවේ බිත්තියට බාහිරව ඇති කෝෂ්ටපංජරයේ පිහිටා තිබේ.
(3) මෙම මූර්තය ශිව දෙවියන්ගේ දිව්‍යමය කාන්තිමත් ආලෝකයේ ආරම්භය සහ නිමාව විෂ්ණු දෙවියන් සහ බ්‍රහ්ම දෙවියන් සෙවූ පුරාණ කථා පුවත හා සම්බන්ධයි.
(4) මූර්තයේ දකුණු පසට ඉහළින් ඉගිලෙන හංසයා සහ වම් පස පහළින් ඌරා ද තිබේ.
(5) ලිංගෝත්පව මූර්තයෙන් පෙන්නුම් කෙරෙන්නේ ශිව දෙවියන් සාර්ව දෙවියන් බවයි.

● අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, එයට සුදුසු ඒවා **I, II, III, IV** යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>ශිව දෙවියන් තිරිපුරම් පිළිස්සූ කතා පුවත | F<br>ගීතිකා මගින් භක්ති ව්‍යාපාරය දියුණු කිරීම | K<br>ශිවතොණ්ඩන් පුවත්පත | P<br>අජන්තා |
| B<br>මුන්නේෂ්වරම | G<br>නර්තනයේ යෙදෙන කාන්තාවන්ගේ ලාලිත්‍යය | L<br>රාමගේ රජ කිරුළ පැළඳීමේ උත්සවය | Q<br>දාර්ශනික පර්යේෂණ උතුම් තත්ත්වයට ඉහළ නැංවූවකි |
| C<br>ග්‍රාමීය ජනතාව අතර ආගමික කැමැත්ත ඇති කිරීම | H<br>දේශනා සංස්කෘතිය වර්ධනය වීම | M<br>පුරාණ කතා පුවත් සම්බන්ධ කර ගී ගැයීම | R<br>ගති ලක්ෂණ අටකින් සමන්විත වීම |
| D<br>ආත්මය විසින් කරන ලද වරද පැහැදිලි කිරීම | I<br>උපනිෂද් මගින් කියවෙන තොරතුරු පහසුවෙන් දැනගැනීමට උදවු කරන්නෙකි | N<br>අඳුරටත් වඩා දරුණුයි | S<br>නාට්ටුක්කෝට්ටෙ නගර වැසියන්ගේ සේවය |
| E<br>බ්‍රහ්මම් සර්ව දෙවියන් බව පැහැදිලි කිරීම | J<br>මහත් ශක්තීන්ගෙන් යුක්ත වීම | O<br>පාදරායණර් | T<br>ආගමික ප්‍රචාරයට ගීතිකා භාවිත කිරීම |

**46.** හින්දු සිතුවම් කලාව හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AGLP (2) BFMT (3) CFMT (4) DJNR (5) EIOR

**47.** ශ්‍රී ලංකාවේ හින්දු භක්තිකයින්ගේ ආගමික හා සමාජයීය වර්ධනය හා සම්බන්ධ කාණ්ඩය තෝරන්න.
(1) AFKQ (2) BHKS (3) CHKS (4) DIOR (5) EJNR

**48.** තමිල්නාඩුවේ ආල්වාර්ලාගේ ආගමික සේවා පිළිබඳ කරුණු ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) AFMT (2) BGKS (3) CFMT (4) DJOR (5) EHLR

**49.** බ්‍රහ්ම සූත්‍රයේ විශේෂතා පිළිඹිබු කරන කාණ්ඩය කුමක් ද?
(1) AJOR (2) BFMT (3) CINQ (4) DINR (5) EIOQ

**50.** ශෛව සිද්ධාන්තය පැහැදිලි කරන 'ආණවම්' හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AHKP (2) CFMT (3) DGNT (4) DJNR (5) EFMQ

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

**46 S II**

**2018.08.07 / 0830 - 1140**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

*උපදෙස් :*

✳ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. හින්දු ශිෂ්ටාචාරය වර්ධනය කරවීමෙහි ලා 'පුරාණංගල්' ලබන වැදගත්කම පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විමසන්න.
   (අ) පුරාණංගල්වල ලක්ෂණ පහ
   (ආ) පුරාණංගල් වර්ග
   (ඉ) පුරාණංගල් මගින් පැහැදිලි කරන වන්දනා ක්‍රම

2. තමිල්නාඩුවේ පල්ලව යුගයේ බිහි වූ ශෛව භක්ති ව්‍යාපාරයේ ප්‍රධාන අංග පහත සඳහන් කරුණු ඇසුරෙන් විමසන්න.
   (අ) රජවරුන්ගේ දායකත්වය හා සේවා
   (ආ) නායන්මාර්ලා කළ සේවා
   (ඉ) දේවාල වන්දනාව

3. නූතන හින්දු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය පිළිබඳව පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විමසන්න.
   (අ) දහනවවන සියවසේ සමාජ පසුබිම
   (ආ) රාජාරාම් මෝහන්රායි
   (ඉ) ස්වාමි දයානන්ද සරස්වතී

## II කොටස

4. "උපනිෂද් යනු හින්දු දාර්ශනික වර්ධනයේ මූලය වේ" යන්න පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විමසන්න.
   (අ) උපනිෂද් බිහි වූ පසුබිම
   (ආ) උපනිෂද් මහා වාක්‍ය
   (ඉ) හින්දු දාර්ශනික වර්ධනය සඳහා උපනිෂද්වල දායකත්වය

5. චෝල යුගයේ දේවාල ආශ්‍රිත ගෘහ නිර්මාණ ශිල්පයේ වර්ධනය පහත සඳහන් ඒවා ඇසුරෙන් විස්තර කරන්න.
   (අ) චෝල මහරජවරුන්ගේ දායකත්වය සහ සේවා
   (ආ) දේවාල ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂතා
   (ඉ) මූර්ති

6. "ශ්‍රී ලාංකේය ශෛව ආගමික වර්ධනය සඳහා ශෛව ආගමික විශාරදයින් වන කාසිවාසි සෙන්දිනාදෛයර් සහ ස්වාමි විපුලානන්දර් යන අය ලබා දුන් සේවාව සුවිශේෂිත ය." විමසන්න.

[දෙවැනි පිටුව බලන්න.

**7.** අග්නිදිග ආසියාතික රටවල හින්දු ශිෂ්ටාචාරය වර්ධනය වූ ආකාරය පහත සඳහන් කරුණු ඇසුරෙන් විමසන්න.
(අ) හින්දු ශිෂ්ටාචාරය වර්ධනයට හේතු
(ආ) ආගමික වර්ධනය
(ඉ) කලාව
(ඊ) සාහිත්‍යය

**8.** පහත සඳහන් ඒවායින් **හතරකට** කෙටි සටහන් ලියන්න.
(අ) කතරගම දේවාලය
(ආ) විෂ්ණු දෙවියන්ගේ අවතාර දර්ශන
(ඉ) ගුප්ත යුගයේ කලාවන්
(ඊ) හින්දු දේශපාලනයේ වැදගත් අංග
(උ) ගුරුකුල අධ්‍යාපනය
(ඌ) කන්නගි දෙවියන් වන්දනාව

* * *